# ගොවිතැන් කටයුතුවල දියුණුවට ඇති හේතු සහ බාධක

ලෝකයේ රටවල් ගණනාවකම අද ආහාර අහේනියක් පවතින බව අපි කවුරුත් දන්න කාරණයක්. කෑම හිඟකම නිසා හැම රටකම වගේ ඒවායේ මිල ගණන් ඉහල ගිහින් තියෙනවා. දවසෙන් දවස තව තවත් ඉහල යනවා. තව ටික කලක් යනකොට මේ තත්වය මීට වඩා දරුණු වෙන්න පුළුවනි. මේ තත්වයෙන් බේරෙන්න තියෙන එකම මාර්ගය අපිට උවමනා කරන ආහාර පුළුවන් තරම් මේ රටේම වවා ගන්න එකයි. ඒ විතරක් නොවෙයි; පුළුවන් තරම් ඉක්මණින් මේ වැඩය කරන්නත් ඕනෑ. මේ වැඩේට රටේ හැම දෙනාගෙම සම්පූර්ණ සහයෝගය අවශ්‍යයි. කොටින් කියනවා නම් අපිට අවශ්‍ය ආහාර පුළුවන් තරම් අපේ රටේම නිපදවා ගන්න එක ජාතික වගකීමක් බවට දූන් පත්වෙලා තියෙනවා.

ගොවිතැන ගැන පොදුවේ කල්පනා කරන කොට අපිට හොඳට පැහැදිලිව පෙනෙන එක වැදගත් කාරණයක් තියෙනවා. ගොවිතැන් කරන සමහර දෙනා හුඟක් උනන්දුවෙන්, උවමනාවෙන් ඒ වැඩය කරනවා. තමන්ගේ කුඹුරෙන් හෝ වේවා, ගොඩ ගොවිතැනෙන් හෝ වේවා, ඉහලම අස්වැන්න ලබාගෙන ආදයම වැඩි කර ගන්න ඔවුන් නිතරම මහන්සි වෙනවා. ඒ වගේම උපදෙස් පිළිපදින්න ඔවුන් කැමතියි. කොටින් කියනවා නම් ඒ වගේ අය හැම තිස්සේම බලන්නේ මොන විදියකින් හරි පලදාව වැඩි කර ගන්න. ගොවිතැන් දියුණු කරන්න ඒ තරම් උනන්දුවක් දක්වන්නෙ නැති තව සමහර දෙනෙක් ඉන්නවා. තමන්ගේ ගොවිතැනෙන් ලැබෙන පලදාව වැඩි කර ගන්නවත්, ඉඩ කඩම් වලින් වැඩිම ප්‍රයෝජන ගන්නවත් ඔවුන් ඒ තරම් උත්සාහ කරන්නෙ නැහැ. වැඩි වියදමක් නැතුව ආදයම වැඩි කර ගන්න පුළුවන් ක්‍රම ගැන උපදෙස් ලැබුනත් එහෙම දෙයක් ගැන මහන්සි වෙන්නත් ඔවුන් කැමති නැහැ. යම්කිසි දෙයක් කරන්න පුළුවන්කම තිබුනත් ඒ අය උනන්දු වෙන්නෙ නැහැ. මේ කිව්ව කොටස් දෙකටම වඩා හුඟක් වෙනස් තව කොටසක් ඉන්නවා. ඒ තමයි ගොවිතැන ගැන උදාසීන ගතියක් දක්වන අය. ඔවුන් ගොවිතැන් කරන්නෙ ආවට ගියාට වගේ. පරණ ක්‍රම වෙනස් කරන්න ඔවුන් කැමති නැහැ. මේ උදාසීන ගතිය නිසා හැමදම ඔවුන් ඉන්නේ හිටපු අඩියෙමයි.

අද මේ රටේ වවන ඕනෑම බෝගයක් හොඳ මිල ගණන්වලට විකුණන්න පුළුවනි. ඒ විතරක් නොවෙයි. සහන ගණනාවක් ආණ්ඩුවෙන් සලස් සලා තියෙනවා. ඒ වගේ තත්වයක් තියෙද්දි සමහර ගොවි මහත්වරු වැඩියෙන් නිපදවන්න පෙළඹෙන අතර තවත් සමහර අය එහෙම නොකරන්නෙ මොන හේතුවක් නිසාද? එහෙම නොකරන්න මොනව හරි බාධාවල් තියෙනවද? මේ ප්‍රශ්නවලට උත්තර ලබා ගන්න අදහස ඇතුව අපි අම්පාර, කෑගල්ල සහ යාපනය යන දිස්ත්‍රික්කවල ගොවි මහත්වරු 25 දෙනෙක් විතර මූන ගැහිල කතා කළා. මේ ලිපිය සකස් කරලා තියෙන්නෙ ඔවුන් සමඟ අපි කරපු සාකච්ඡා ආශ්‍රයෙන්. ගොවි මහත්වරු අපි එක්ක කියාපු කරුණු හුඟක් දුරට ඒ විදියටම අපි ඉදිරිපත් කරලා තියෙනවා.

## අම්පාර දිස්ත්‍රික්කය

අම්පාර දිස්ත්‍රික්කයේ අපිට මුන ගැහුනේ අක්කරපත්තුව, තිරුකෝවිල්, තම්බිලුවිල් සහ පානම යන ප්‍රදේශවල ගොවි මහත්වරු. ඒ පලාත්වල ගොඩ මඩ දෙකම ගොවිතැන් කරන ගොවි මහත්වරු අපට මුන ගැහුනා. විශාල වශයෙන් රට කජු වවන ගොවි මහත් වරු සමඟ කතා කරන්නත් අපිට අවස්ථාව ලැබුනා. නොයෙක් විදියේ අමාරුකම්වලට ඒ ගොවි මහත්වරු මුහුන දෙනවා. මෙ පලාත්වල ගොවි මහත්වරුන්ට මුහුන දෙන්න වෙලා තියෙන ලොකුම ප්‍රශ්නය වතුර ලබා ගන්න හරි හැටි වාරිමාර්ග පහසුකම් නැති කමයි.

**මේ ප්‍රශ්නය ගැන අක්කරපත්තුවේ, අංක 2 කොටසේ, මහ වීදියේ පදිංචි මොහමඩ් අබුබකර් සාර්දීන් මහතා අප සමඟ කතා කළා.** ඔහුගේ වයස අවුරුදු 35 යි. ගොඩ ඉඩම් අක්කර දෙකකුත්, කුඹුරු අක්කර තුනකුත් ගොවිතැන් කරන සාර්දීන් මහතා අවුරුදු පහලොවකට වැඩි කාලයක් තිස්සේ ගොවිතැන් කරගෙන ආපු කෙනෙක්. ඔහු කවදවත් වෙන කිසිම රක්ෂාවක් කරලා නැහැ. ඔහුගේ කතාව මෙන්න මෙහෙමයි: ''මේ පලාතේ පොඩි පොඩි වැව් ගණනාවක් තියෙනවා. නම් වශයෙන් කියනවා නම් පන්නලගම වැව, අම්බලන් ඔය, සාගම වැව සහ පන්නිල ඔය යන වැව් ගැන විශේෂයෙන් සඳහන් කරන්න පුළුවනි. මේ වැව් හැම එකක්ම වගේ හුහක් අබලන් වෙලා. ඒවායින් වතුර ලබා ගන්න හරි හැටි වාරිමාර්ග පහසුකම් නැහැ. මේ හේතුව නිසා අපේ කුඹුරු කන්න දෙකම වැඩ කරන්න බැහැ. මේ වැව් ටික අළුත්වැඩියා කරලා දියුණු කරනවා නම් මේ ප්‍රදේශයට වතුර ප්‍රශ්නය බලපාන්නෙ නැහැ. අපේ කුඹුරු වලින් දැන් ලැබෙනවාට වඩා වැඩියෙන් අස්වැන්න ලබා ගන්නත් පුළුවන් වෙනවා.''

**අවුරුදු 34 ක විතර කාලයක් තිස්සේ ගොවිතැන් කරගෙන ආපු තිරුකෝවිල්හී කේ. නාගමනි මහතා වතුර හිඟකම ගැන තවත් විස්තරයක් ඉදිරිපත් කළා.** ඔහු කුඹුරු අක්කර තුනකුත්, රට කජු අක්කර 3 1/2 කුත් වගා කරන කෙනෙක්. වතුර ලබා ගන්න තියෙන අමාරුකම හින්ද ඔහු ගොවිතැන් කරන්නෙ වැහි වතුරෙන්. ඔහු කිව්වේ වැස්ස ලැබෙන හැටියට වැඩ කරන්න සිද්ද වෙලා තියෙන්නෙ වතුර නැතිකම නිසාම නොවෙයි. ඒ පලාතෙ තියෙන පොඩි පොඩි වැව් වලින් වතුර ලබා ගන්න බැරිකමයි. නාගමනි මහතා කියන හැටියට සාගම වැවේ බැම්ම ටිකක් උස්සන්න පුළුවන් නම් ඒ ප්‍රදේශයේ තවත් කුඹුරු අක්කර 2000 කට විතර වතුර ලබා ගන්න පුළුවනි. ඒ පලාතේ 1967 දී හදවපු කන්ජිකුඩිච්චආරු කියන වැවට තවම සොරොව්වක් දමල නැති නිසා ඒ වැවේ තියෙන වතුර අපතේ යන බවක් ඔහු කියා හිටියා. නාගමනි මහතාගේ අදහසෙ හැටියට සොරොව්වක් දමන්න ඒ තරම් වියදමක් යන්නෙ නැහැ. ලොකු වියදමක් දරලා වැව හරි ගස්සලා ඒ වැවේ තියෙන වතුර ටික අපතෙ යන්න දෙන එක මොන තරම් අපරාදයක්ද කියලා ඔහු ප්‍රශ්න කළා. ඒ යායෙ ගොවි මහත්වරු වතුර ලබා ගන්න බැරුව දුක් විදින කොට කන්ජිකුඩිච්චආරු වැවේ වතුර අපතෙ යන එක බලාගෙන ඉන්න බැරි තරම් කණගාටුදයක කාරණයක් බව ඔහු අවසාන වශයෙන් කියා හිටිය.

**තම්බිලුවිල්හි පදිංචි ආර්. එලියතම්බි මහතා අප සමඟ පැවසුවේ ඒ ප්‍රදේශයේ වතුර හිඟකම මග අරවා ගන්න ඒ තරම් අමාරු නැති බවයි.** ගොවිතැන ගැන අවුරුදු 38 ක විතර පළපුරුද්දක් තියෙන ඔහු වාරිමාර්ග විදනෙ කෙනෙක්. ඔහු කියන හැටියට ඒ පලාතෙ වැහි වතුරෙන් වැඩ කරන ඉඩම් අක්කර 12,000 ක් විතර තියෙනවා. මේ ඉඩම්වලට වාරිමාර්ග පහසුකම් නැහැ. නමුත් ලොකු වියදමක් දරන්නෙ නැතුව වතුර ලැබෙන්න සලස්වන්න පුළුවනි. එලියතම්බි මහතාගේ කුඹුරුවලට කිට්ටුවෙන් ඇලක් තියෙනවා. ඒ ඇල හරහා අමුණක් බඳිනවා නම් අඩු ගණනේ අක්කර 500 කට විතර වතුර ගන්න පුළුවන් වෙන බව ඔහු පැවසුවා. මේ ගැන ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර ඇතත් තවම කිසි සහනයක් ලැබුනෙ නැති බවයි ඔහු කියා හිටියෙ. එලියතම්බි මහතාගේ

අදහසේ හැටියට දැනට එක කන්නයක් විතරක් වැඩ කරන ඒ යායෙ කුඹුරු වලින් මීට වැඩියෙ ප්‍රයෝජන ගන්න පුළුවනි. අහල පහල තියෙන පොඩි පොඩි වැව් වලින් වතුර ලබා ගන්න පුළුවන්කමක් ඇති කරනවා නම් කන්න දෙකම වැඩ කරන්න අමාරු නැහැ. ඒ වගේම මීට වැඩියෙ අස්වැන්න ලබා ගන්නත් පුළුවනි. තමා එහෙම කියන්නෙ වාරිමාර්ග විදනෙ කෙනෙක් හැටියට හොඳ දැනීමක් තියෙන නිසා බව ඔහු කියා හිටිය.

**පානම ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් රට කජු වවන ගොවි මහත්වරු කියා හිටියෙත් ඒ අවට තියෙන වැව් වලින් වතුර ලබා ගන්න වාරිමාර්ග පහසුකම් සලස්වනවා නම් මීට වඩා හුඟක් හොඳට ගොවිතැන් කරන්න පුළුවන් වෙන බවයි. රට කජු අක්කර පහකුත් කුඹුරු අක්කර තුනකුත් ගොවිතැන් කරන උතුරු පානම පදිංචි කේ. ඇම්. අප්පුරාල මහතා මේ ප්‍රශ්නය ගැන ටිකක් වෙනස් විදියකට කතා කළා.** ඔහු කියන හැටියට කුඹුරු අක්කර 6000 ක් විතර තියෙන පානම ප්‍රදේශයේ අක්කර 2000 කට වැඩියෙ දැනට වැඩ කරන්නෙ නැහැ. මේ අක්කර 2000 වගා කරන්නෙත් වැහි වතුරෙන්. වතුර ලබා ගන්න තියෙන අමාරුකම නිසා මේ වගේ තත්වයක් උදවෙලා තියෙද්දීත් විලඹයේ වතුර නිකරුනේ මූදට ගලාගෙන ගිහින් අපතෙ යනවා. මොකක් හරි පිළිවෙලක් යොදනවා නම් තව ඉඩම් අක්කර දස් ගණනක් වැඩ කරන්න පුළුවන් බව අප්පුරාල මහතා කියා හිටියා. ඔහු කියන හැටියට සිංහල රජ කාලෙ ඉඳලා තියෙන වැව් ගණනාවක් ඒ පලාතෙ තියෙනවා. වැස්ස කාලෙට ඒ වැව් පිරිලා උතුරලා යනවා. නමුත් ඒවයෙ එකතු වෙන වතුර ටික කුඹුරු වලට ගන්න ක්‍රමයක් නැහැ. ඒවයින් වතුර ගන්න ඉස්සර තිබුන ඇල පාරවල් දැන් ගොඩ වෙලා ගිහින්. මේ ඇල පාරවල් සුද්ද කරලා පිළිවෙලක් කරලා දෙනව නම් ඔවුන්ගේ කුඹුරු වලින් මීට වඩා පලදව ගන්න පුළුවන් වෙන බව අප්පුරාල මහතා පැවසුවා.

**වතුර හිඟකම වගේම බරපතල ප්‍රශ්නයකට මාස් කන්නයේදී සමහර පළාත්වල ගොවි මහත්වරු මූන දෙනවා. ඒ වතුර වැඩිකම නිසා ඇති වෙන ප්‍රශ්නය. වැස්ස කාලෙට සමහර කුඹුරුවල වතුර පිරුනාම මාස ගණනක් යනකල් වතුර බහින්නෙ නැහැ. ඒකට හේතුව ඇත්ත වශයෙන් හරි හැටි වාරිමාර්ග පහසුකම් නැතිකමයි. මේ නිසා සමහර කුඹුරු කොහෙත්ම වපුරන්න බැරි වෙනවා. තිරුකෝවිල්හි පදිංචි කේ. වේලුපිල්ලේ මහතාට මේ ප්‍රශ්නය හුඟක් තදින් බලපාන කෙනෙක්.** ඔහුගේ වයස අවුරුදු 59 යි. ඔහුට දරුවන් 9 ක් ඉන්නවා. කුඹුරු අක්කර 15 කුත් ගොඩ ඉඩම් අක්කර 7 කුත් අයිති වේලුපිල්ලේ මහතා අවුරුදු 35 කටත් වැඩි කාලයක් තිස්සේ ගොවිතැන් කරගෙන ආපු කෙනෙක්. කුඹුරු අක්කර 15 ක් තිබුනත් දැන් ඒවයේ කිසිම ගොවිතැනක් කරන්න බැරි බව ඔහු කියා හිටිය. පොඩි වැස්සකට උනත් ඔහුගේ කුඹුරුවල වතුර පිරෙන බවත්, මේ තත්වය ඇති වුනේ 1957 ගංවතුරෙන් කුඹුරු හෝද පාලු උනාට පස්සෙ බවත් වේලුපිල්ලේ මහතා පැවසුවා. මේ ගැන නොයෙක් තැන්වලට කරුණු ඉදිරිපත් කළ නමුත් මේ දක්වා කිසිම සහනයක් ලැබුනේ නැති බව ඔහු කිව්වා. තමන්ගේ වියදමෙන් මේ කුඹුරු ටික හරිගස්සා ගන්න තරම් මුදල් නොතිබුන නිසා මෙච්චර කලක් ගතවුන බවත්, ඒ පලාතට අළුතෙන් පත්කරලා තියෙන පලද වර්ධන කමිටුවේ උදව්වෙන් මොනවා හරි කරන්න බලාපොරොත්තුවෙන බවත් වේලුපිල්ලේ මහතා අවසාන වශයෙන් කියා හිටිය.

**අම්පාර දිස්ත්‍රික්කයේ සමහර පලාත්වල, විශේෂයෙන් අක්කරපත්තුව ප්‍රදේශයේ ගොවිතැන් දියුණු නොවෙන්න තවත් ලොකු හේතුවක් තිබෙන බව අපට පෙනී ගියා. තමන් ගොවිතැන් කරන ඉඩම් සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගනියි කියන ලොකු බයක් හුඟක් ගොවි මහත්වරුන්ගේ හිතේ පවතිනවා. මේ බය නිසා ගොවි මහත්වරු ඔවුන්ගේ ඉඩ කඩම් දියුණු කරන්න උත්සාහ කරන්නෙ නැහැ. ඉඩම් දියුණු නොකරන හින්ද ලැබෙන අස්වැන්න අඩු බව අප සමග කියා හිටියේ අක්කරපත්තුවේ සින්න පල්ලි පාරේ පදිංචි ඒ. ඇම්. ඊබ්‍රාහිම් මහතායි.** ගොවිතැන ගැන අවුරුදු 25 ක විතර පළපුරුද්දක් තියෙන ඔහු කියන

හැටියට හුඟක් කාලයක ඉඳල ඒ ප්‍රදේශයේ කාටවත් තමන් වැඩ කරන ඉඩම්වලට බල පත්‍ර ලැබිල නැහැ. බලපත්‍ර නොදෙන්න හේතුව ලඟදීම ඒ ඉඩම් සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගන්න යන හින්ද කියලා හැම කෙනෙක්ම හිතාගෙන ඉන්නවා. ඊබ්‍රාහිම් මහතාගේ අදහසේ හැටියට සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගන්න ඕනෑ නම් ඇති තරම් ආණ්ඩුවේ ඉඩම් ඒ අවට පලාත්වල තියෙනවා. ඒ ප්‍රදේශයේ සියට අනූවකටත් වැඩියෙන් කෙරෙන්නේ වී ගොවිතැන නිසා කුඹුරු ටික සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගත්තොත් ඒවායේ මෙච්චර කාලයක් වැඩ කරගෙන ආපු ගොවි මහත්වරුන්ට ජීවත් වෙන්න වෙන මාර්ගයක් නැතුව යනවා. දැනටමත් සමහර ගොවි මහත්වරුන්ගේ ඉඩම් ඒ විදියට පවරාගෙන තියෙන නිසා හුඟක් ගොවි මහත්වරු කිසිම උනන්දුවක් ඇතුව ගොවිතැන් කරන්නෙ නැති බව ඔහු කියා හිටිය.

**මැතකදී සිරුනීත කියන පලාතේ වපුරලා තිබුන කුඹුරු අක්කර 500 ක් විතර ඒ කන්නෙ අවසානෙදී සීනි සංයුක්ත මණ්ඩලයට අර ගත්ත බව අප සමග පැවසුවේ අක්කරපත්තුවේ, පළමුවෙනි කොටසේ පදිංචි ඇම්. ඒ. කලන්දන් ලෙබ්බෙ මහතායි.** කුඹුරු අක්කර හතක් වැඩ කරන ඔහුට ගොවිතැන ගැන අවුරුදු 10 ක විතර පළ පුරුද්දක් තියෙනවා. ඔහු කියා හිටියේ කාලයක් තිස්සේ වවාගෙන හදගෙන ආපු ඉඩම් ගණනාවක්ම දැන් ටික කලක ඉඳලා පුරන් වෙන්න තරම් තත්වයකට ඇවිත් තියෙන බවයි. ඒ කියන්නේ සමහර ඉඩම් වල ඒ තරමටම කැලේ වැවිලා. තව ටික දවසක් ගත වෙන කොට සීනි සංයුක්ත මණ්ඩලයේ නිලධාරී මහත්වරු ඇවිල්ලා මේ ඉඩම් පවරා ගනියි කියන බය හිතේ තියෙන නිසයි මෙහෙම වෙලා තියෙන්නේ. මේ බය නිසා මහන්සි වෙලා වැඩ කරන්න කවුරුවත් කැමති නැහැ. ඒ වගේම, ඉඩම් දියුණු කරන්න කවුරුවත් කිසිම උත්සාහයක් ගන්නෙත් නැහැ. කලන්දන් ලෙබ්බෙ මහතා කියන හැටියට මේ ඉඩම් පවරා ගන්නෙ නැහැයි කියල සීනි සංයුක්ත මණ්ඩලයෙන් පොරොන්දුවක් ලැබෙනව නම් වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා කුඹුරු දියුණු කරලා හොඳ අස්වැන්න ලබා ගන්න එක අමාරු කාරියක් නොවෙයි. ඕනෑ තරම් ඉඩම් ඒ අවට පලාත්වල තියෙද්දී අස්වද්දලා තියෙන කුඹුරු ටික සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගන්න හදන්නෙ මොන හේතුවක් නිසාද? කියලා ඔහු ප්‍රශ්න කලා.

මේ කියාපු ලොකු ප්‍රශ්න ඇරුනාම ට්‍රැක්ටර් හිඟකම, කලට වෙලාවට ණය, පෝර, බෙහෙත් ජාති නොලැබීම වගේ සාමාන්‍ය යෙන් හැම පලාතකම වගේ තියෙන අමාරු කම් මේ කියපු ප්‍රදේශවලත් තියෙන බව අපට පෙනුනා. විශේෂයෙන් සමුපකාර යෙන් ලබා ගන්න තියෙන දේවල් කොහෙත්ම කලට වෙලාවට නොලැබෙන බව හුඟක් ගොවි මහත්වරු කියා හිටියා. ට්‍රැක්ටර් හිඟකම වැඩියෙන් පවතින්නේ තිරුකෝවිල්, තම්බිලුවිල් සහ පානම යන ප්‍රදේශවල බව ඒ ඒ පලාත්වල ගොවි මහත්වරු අප සමඟ කරපු කතා වලින් පැහැදිලි වුනා. තමන්ගේ ඉඩම් හාන්න කලට වෙලාවට ට්‍රැක්ටර් ලබා ගන්න අමාරු නිසා අස්වැන්න අඩු වෙන බවත්, සමහර වෙලාවට කන්නය පරක්කු වී පාලුවෙන බවත් එක ගොවි මහතෙක් අවධාරනයෙන් කියා හිටිය. එහෙම කිව්වේ ගොවිතැන ඇරෙන්න කවදවත් වෙන රක්ෂාවක් කරලා නැති වයස අවුරුදු 56 ක් පහු වෙලා ඉන්න **තිරුකෝවිල්හි පදිංචි කේ. නාගමනි මහතායි.** ඔහු කිව්ව හැටියට ඒ ප්‍රදේශයේ සමහර කන්නවලදී වැස්ස තියෙන වෙලාවට ට්‍රැක්ටර් ලැබෙන්නෙ නැහැ; ට්‍රැක්ටර් ලැබෙන වෙලාවට වැස්ස ලැබෙන්නෙ නැහැ. ඒ වගේ කන්න හුඟක් වෙලාවට පාලු වෙනවා.

**අවුරුදු 50 ක් වයස ඇති පානම, හොඳවිල පදිංචි එස්. කලුබණ්ඩාර මහතාත් මේ වගේ කතාවක් කිව්වා.** ගොවිතැන ගැන අවුරුදු 30 කටත් වැඩියෙ පළපුරුද්දක් තියෙන ඔහු කිව්වෙ, කුඹුරු හාන්න ට්‍රැක්ටර් හොයා ගන්න එකත් හරියටම සමුපකාරෙන් ණය ලබා ගන්නව වගේ අමාරු වැඩක් කියලයි. ඒකට හේතුව පානමට ට්‍රැක්ටර් ගෙන්න ගන්න තියෙන්නේ එක්කෝ පොතුවිල් ඉඳලා; එහෙම නැත්නම් අක්කරපත්තුවේ

ඉදලා. ඒ විදියට හැතැම්ම විස්සක් තිහක් විතර දුර ඉදල ට්‍රැක්ටර් ගෙන්න ගත්තම වෙලාවට ලැබෙන්නෙත් නැහැ; වැඩිපුර මුදලක් ගෙවන්නත් වෙනවා. ට්‍රැක්ටර් හිඟකම වතුර හිඟකම වගේම බරපතල ප්‍රශ්නයක් බව කලුබණ්ඩාර මහතා කියා හිටිය.


මේ වගේ ප්‍රශ්න තියෙද්දි ගොවිතැන් වැඩ දියුණු කරන්න කොහොමටවත් බැරි බවත්, දිගටම ගොවිතැන් කරගෙන යන එකත් ලේසි පාසු වැඩක් නොවෙන බවත් හුඟක් ගොවි මහත්වරු අප සමග කියා හිටිය. අද තියෙන බඩු මිළ ගණන්වල හැටියට දෑන් ලැබෙන ණය මුදල නම් කොහොමටවත් මදි බව ඔවුන් හැම කෙනෙක්ම වගේ කියාපු කතාවක්.

## කෑගල්ල දිස්ත්‍රික්කය

කෑගල්ල දිස්ත්‍රික්කයේ අපට මුන ගැහුන ගොවි මහත්වරු අපි තෝර ගත්තෙ මාව නැල්ල ප්‍රදේශයෙන්. මේ ප්‍රදේශයේ ගොවි මහත්වරුන්ට තියෙන පළමුවෙනි බාධාව විදියට අපට පෙනුනේ ඉඩම් හිඟ කමයි. රබර්, පොල් වගේ සාමාන්‍ය බෝග වවල තියෙන ඉඩම් ඇරුනාම සරුවට ගොවිතැන් කරන ගොවි මහත්වරු ඉන්නේ බොහොම ටිකයි. ඒ වගේම තමන්ගේම මඩ ඉඩම්වල වගා කරන අයගේ ගණනත් අඩුයි. අක්කර කාලක් හෝ බාගයක් මඩ ඉඩම් අයිති හැම කෙනෙක්ම වගේ තව සුළු ප්‍රමාණයක් අදේ ටත් වැඩ කරනවා. අපට මුන ගැහුන ගොවි මහත්වරුන්ගෙන් වැඩි දෙනෙක් ඒ විදියට අදේට හෝ තට්ටුමාරු ක්‍රමයට ගොවි තැන් කරන අය. ඒ හැම කෙනෙක්ම වගේ කියා හිටියේ තව ඉඩම් ලැබෙනව නම් ගොවිතැන් කරන්න කැමති බවයි.

ඉඩම් හිඟකම ඇරුනාම මාවනැල්ල ප්‍රදේශයේ ගොවි මහත්වරු මුහුන දෙන තවත් ලොකු බාධවක් තමයි වතුර ප්‍රශ්නය. වාරිමාර්ග ක්‍රම නැති නිසා සීයට සීයක්ම වගේ ගොවිතැන් කරන්නේ වැස්ස ලැබෙන හැටියටයි. වැඩි දෙනෙකුට යල කන්නයේ ගොවිතැන් කරන්න ලැබෙන්නෙ නැහැ.

මාවනැල්ලේ, පල්ලෙ පමුණුවේ පදිංචි ආර්. ඒ. ඩී. ගුණසේකර මහතා අප සමඟ කියාපු කරුණු වලින් ඉඩම් හිඟ කමත්, වතුර හිඟකමත් ඒ ප්‍රදේශයේ ගොවි මහත් වරුන්ට කොයි තරම් දුරට බලපානවාද කියන එක හොඳට පැහැදිලි වෙනවා.



ගොවිතැන් කරන්න ඉඩමක් ලැබෙනව නම් ගමෙන් ඈත පලාතකට උනත් යන්න සූදනම් බව කියා හිටිය ආර්. ඒ. ඩී. ගුණසේකර මහතා

අවුරුදු 29 ක් වයස ඇති ඔහු අක්කර 1 3/4ක් තට්ටු මාරු ක්‍රමයටත්, තව අක්කර 3/4 ක් අදේටත් වැඩ කරනව. ගොවිතැන් කරන්න තව ඉඩම් ලැබෙනවා නම් ඔහු කැමතියි. ඔහු කියන හැටියට ගමෙන් ඈත පලාතක උනත් ඉඩමක් ලැබෙනව නම්, ගිහිල්ලා ගොවිතැන් කරන්න ලෑස්තියි. ඔහුට මල්ලිලා දෙන්නගේ උදව්ව ලබා ගන්නත් පුළුවනි. සමුපකාර ජනාවාස යෝජනා ක්‍රමයටක ඇතුළත්ව ගොවිතැන් කරන්න ලැබෙනවා නම් තමා කැමති බව ගුණසේකර මහතා අප සමඟ කියා හිටිය. වාරිමාර්ග පහසුකම් ඒ පලාතේ නැහැ. ඒ නිසා ගොවිතැන් කරන්න සිද්දවෙලා තියෙන්නෙ වැස්ස ලැබෙන හැටිය ටයි. වතුර හිඟකම හින්ද කුඹුරු වලින් ඉහල අස්වැන්නක් ලබා ගන්න අමාරුයි. ඇරත් සමහර කන්නවලදී කලට වේලාවට වතුර ගන්න බැරි වෙනවා. ඒකට හේතුව කුඹුරු හාන්න මී හරක් හොයා ගන්න ටිකක් අමාරු

නිසයි. ඒ වගේම පෝර, බෙහෙත් ජාති සමුපකාරෙන් නියම වෙලාවට ලැබෙන්නෙ නැහැ.

**මේ වගේම තවත් කතාවක් අප සමඟ පැවසුවේ මාවනැල්ලේ, මාලියැද්ද ගමේ, ඇල්පිටි පාරේ පදිංචි ඩබ්ලිව්. ඇම්. සෙනෙවිරත්න මහතායි.** ඔහුගේ වයස අවුරුදු 28 යි. කට්ටිමාරු ක්‍රමයට නොබෙදපු ගොඩ ඉඩම් අක්කරයකුත්, අඳේට කුඹුරු අක්කර 1/2 කුත් වැඩ කරන ඔහු කිව්වේ ගොවිතැන් කරන ප්‍රමාණය කුඩා නිසා ලැබෙන ආදයම යැපෙන්නටත් මදි බවයි. දිගටම කරගෙන ආපු පුරුද්ද නිසා අඳ කොටස හැටියට අස්වැන්න බාගයක් දෙනවා. මේ නිසා ගෙදර ප්‍රයෝජනයට ඉතුරු වෙන කොටස කොහෙත්ම මදි බව ඔහු පැවසුවා. සහනාධාර ක්‍රමයක් තියෙනව නම් ගොඩ ඉඩම්වල අළුත් බෝග මොනවා හරි වවන්න සූදානම් බවත් ඔහු කීව. සෙනෙවිරත්න මහතා කිව්වෙ තමන්ටත් කොහෙන් හරි අක්කරයක් විතර ලැබෙනවා නම් ගමෙන් පිට යන්න උනත් කැමති බවයි. ළඟ පාත ඉඩම් කට්ටියක් ලැබෙනව නම් පවුලේ අනිත් අයගේ ශ්‍රමයත් යොදවලා වැඩ කරන්න පුළුවන් වන බව ඔහු කියා හිටිය.

**මේ කියන ප්‍රශ්නවලට සම්පූර්ණයෙන්ම වෙනස් තත්වයක් ගැන කතා කරන තරුණ ගොවි මහත්මයෙක් හෙම්මාතගම, ඕලානේදී අපට මූන ගැහුනා. ගඩාදෙස්ස වත්තේ පිහිටුවා තියෙන එක්සත් තරුණ ගොවි සමාජයේ සභාපති හැටියට වැඩ කරන ඔහුගේ නම ඇම්. පාරුක් ෂෙරීප්.** කලින් කොළඹ පුද්ගලික සමාගමක රක්ෂාවක් කළ ඔහු මේ ගොවි සමාජය පටන් ගත්තේ 1973 අගෝස්තු මාසයේදී බව අප සමඟ පැවසුවා. ජ්‍යෙෂ්ඨය සහ උසස් පෙළ සමර්ථ වෙලා ඉන්න තරුණයින් එකොළොස් දෙනෙක් විතර එකතු වෙලා අක්කර 50 ක් ලබාගෙන ගොවිතැන් කරන්න පටන් ගත්තා. දැනට අක්කර 15 ක විතර මයියොක්කා, ඉදල් ඉරිඟු, එළවළු ආදිය වගා කර තියෙන අතර තවත් අක්කර 11 ක් විතර ප්‍රමාණයක කෙසෙල් වගා කර තියෙන බවත් ෂෙරීප් මහතා කිව්වා. ඉතුරු හරියේ තේ සහ රබර් වවන්න අදහස් කරගෙන ඉන්නවා කියලා ඔහු වැඩි දුරටත් කීව. තරුණ සාමාජිකයෝ එක්කෙනෙක් රුපියල් 500/- ක් බැගින් යොදවල ගොවිතැන් වැඩ කරගෙන යනවා. නමුත් තවම ආදයමක් ලැබිලා නැහැ. ඒ නිසා සමහර සාමාජිකයින්ගේ උනන්දුව ටිකක් අඩුවෙලා ගියා. මේ ගොවිපලේ වගා කටයුතු දියුණු කරලා හොඳ තත්වයකට ගෙනෙන්න තව මුදල් උවමනා කරන නිසා ලංකා බැංකුවේ බැම්ණිවත්ත ශාඛාවෙන් ණය ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් යවා ඇති නමුත් මේ දක්වා ණය ලැබුනේ නැති බව ෂෙරීප් මහතා පැවසුවා. ඒ උනත් ව්‍යාපාරය දිගටම ගෙනියන්න අදහස් කරගෙන ඉන්න නිසා මොන විදියකින් හරි මුදල් හොයා ගන්න ඕනෑ බව ඔහු අධිෂ්ඨානයක් ඇතුව කියා හිටියා.

අධිෂ්ඨානයකුත්, උනන්දුවකුත් ඇතුව වැඩ කරන මේ තරුණ ගොවි සමාජයේ සාමාජිකයින්ට තදින්ම බලපාන්නේ මුදල් හිඟකම බව අපට පෙනී ගියා. මෙය ආණ්ඩුවෙන් ආධාර ඇතුව පටන් ගත්ත ව්‍යාපාරයක් නොවෙන නිසා මුදල් ආධාර ලබා ගන්න එකක් ටිකක් අමාරුයි. පෙළඹවීම තිබුනත් මුදල් ප්‍රශ්නය නිසා ඔවුන්ගේ ගොවිතැන් කටයුතුවලට තරමක් දුරට බාධා ඇතිවී තිබෙන බව අපට පැහැදිලි වුනා.

**යාපනය දිස්ත්‍රික්කය**

යාපනය දිස්ත්‍රික්කයේ වී ගොවිතැන් කරන අය හුඟක් අඩුයි. අපට මූන ගැහුන හැම කෙනෙක්ම වගේ මිරිස්, ළූනු, අර්තාපල්, දුම්කොළ වගා කරලා සෑහෙන ආදයමක් ලබා ගත්තු අය. මේ බෝගවලට ලැබෙන මිළ ගණන් හොඳ නිසා කොයිතරම් බාධක තිබුනත් යාපනේ ගොවි මහත්වරු එන්න එන්නම උනන්දු වෙන බවයි අපට පෙනී ගියේ ඒ වගේම, වගා කරන ඉඩම් ප්‍රමාණය කුඩා උනත් හැම ගොවි මහතෙක්ම වගේ කියා හිටියේ ගොවිතැනෙන් තමන්ට ලැබෙන ආදයම ජීවිකාව ගෙනියන්න සෑහෙන බවයි. ගොවිතැන් වැඩවලට තියෙන බාධක වලින් ප්‍රධානම එක වශයෙන් ඔවුන් පෙන්වා දුන්නේ ඉඩම් හිඟකමයි. ඇත්තෙන්ම අපට

මූන ගැහුන හැම ගොවි මහතෙක්ම වගේ කියා හිටියේ තව ඉඩම් ලබා ගන්න පුළුවන් කමක් ලැබෙනවා නම් දූනට වඩා සරුවට ගොවිතැන් කරන්න ඉඩ කඩ ලැබෙන බවයි. හුඟක් ගොවි මහත්වරු ගොවිතැන් කරන්නේ බද්දු ඉඩම්වල. තමන්ගේම ඉඩම්වල ගොවිතැන් කරන අයත් ඉන්නවා. තමන්ට අයිති කුඩා ඉඩම් කට්ටියට අමතරව බද්දු ඉඩම්වල ගොවිතැන් කරන ගොවි මහත්වරුන් අපට මූන ගැහුනා. නමුත් වෙන දිස්ත්‍රික්ක වල වගේ අක්කර හත අට ගොවිතැන් කරන ගොවි මහත්වරු යාපනයෙන් හොය ගන්න අමාරුයි. මීට හේතුව ඉඩම් හිඟකම බව කවුරුත් පිළිගන්න කාරණයක්. ඉඩම් හිඟකම ඇරුනාම යාපනයේ ගොවි මහත් වරුන්ට තියෙන බාධක හැටියට අපට පෙනුනේ ට්‍රැක්ටර්, මී හරක්, උදලු ආදිය හිඟකම, වතුර පොම්ප ලබා ගැනීමට තියෙන අමාරුව සහ පොර, බෙහෙත් ජාති හිඟකම වගේ කරුණුයි. මේවා කලට වෙලාවට ලැබෙනව නම් කරදරයක් නැතුව ගොවිතැන් කරගෙන යන්න පුළුවන් බව හුඟක් ගොවි මහත්වරු කියා හිටිය.

**මේ ප්‍රශ්නය ගැන නීර්වේලිහි, සින්න පට්ටි උතුරේ, ඒ. සින්නතුරෙයි මහතා අප සමඟ කතා කළේ පහත දක්වා ඇති විදියටයි.** අවුරුදු 30 ක් වයස ඇති ඔහුට ගොවිතැන් ගැන හොඳ පළපුරුද්දක් තියෙන බව ඔහු පැවසුවා. මුලදී දෙමාපියන්ගෙ ගොවිතැන් වැඩට උදව්වුන ඔහු දූන් අවුරුදු හත අටක විතර කාලයේ ඉඳල තනියම වැඩ කරනවා. ඔහු වැඩ කරන ඉඩම් ප්‍රමාණය අක්කරයයි. එයින් අක්කර බාගයක් බද්දු ඉඩම්. සින්නතුරෙයි මහතා වැඩි වශයෙන් වගා කරන්නෙ අර්තාපල් සහ මිරිස්. මේවායින් ලැබෙන ආදයම පවුලේ අයගේ නඩත්තුවට සෑහෙනව. පසුගිය අවුරුදු හය ඇතුලේ රු. 25,000/- ක් විතර වියදම් කරලා ගෙයක් හදන්නත් ඔහුට පුළුවන් වෙලා තියෙනවා. ගොවිතැන් කරන්න තව ඉඩමක් හොයා ගන්න පුළුවන් නම් ඔහු කැමතියි. බද්දට හෝ සල්ලිවලට ඉඩමක් හොයා ගන්න උත්සාහ කළ බවත් නමුත් තවම හරි ගියේ නැති බවත් ඔහු පැවසුවා. ඔහු කියා හිටියෙ ගෙදර කරදර තියන නිසා ගමෙන් පිට ගිහිල්ලා ගොවිතැන් කරන්න පුළුවන්කමක් නැති බවයි. ඔහුගේ ගොවිතැන්වලට වතුර ලබා ගන්නෙ පොම්පයකින්. මේ පොම්පයට අමතර කොටස් හොයා ගන්න එක ලොකු ප්‍රශ්නයක් බව සින්නතුරෙයි මහතා කිව්වා. තව ටික කලක් යනකොට අළුත් වතුර පොම්පයක් හොයා ගන්න බැරි වුනොත් ගොවිතැන් වැඩ සේරම ඇන හිටින බව ඔහු වැඩි දුරටත් කියා හිටිය. වැඩි මුදලක් ගෙවල හරි හොඳ වර්ගයේ වතුර පොම්පයක් ලබා ගන්න සූදනම් බව ඔහු අවසාන වශයෙන් පැවසුවා.

**අච්චුවේලි දකුණේ පදිංචි වී. නඩේසු මහතා අවුරුදු 40 ක් වයස ඇති ගොවියෙක්.** තමන්ට අයිති අක්කර කාලට අමතරව අක්කර බාගයක් බද්දු අරගෙන වැඩ කරනවා. ඔහු සාමාන්‍යයෙන් වගා කරන්නෙ බීට්රූට්, ළූනු, මිරිස් සහ කුරහන්. මේ ප්‍රදේශයේ බීට්රූට් සරුවට වැවෙන බවත්, රාත්තල ශත -/35 ගණනේ වික්කොත් අක්කර කාලකින් මාස



වී. නඩේසු මහතා කියා හිටියෙ බද්දු ඉඩම්වල ගොවිතැන් කරන කොට ඉඩම් අයිතිකාරයො ඉල්ලන ගණනක් නොදුන්නොත් කොයි වෙලාවේ ඉඩම ආපහු දෙන්න වෙයිද දන්නෙ නැහැ කියලයි.

2 1/2 ක් ඇතුළත රු. 1000/- ක් විතර ආදයම ලබා ගන්න පුළුවන් බවත් ඔහු කියා හිටියා. අවාසනාවකට වගේ මේ ප්‍රදේශයේ පස්වල තියෙන එක්තරා ගතියක් නිසා පිට පිට දෙවතාවක් බීට්රූට් වවන්න බැරි බව පළපුරුද්දෙන් දූනගෙන තියෙනවා යයි ඔහු

වැඩිදුරටත් පැවසුවා. මේ නිසා ඒ ප්‍රදේශයේ සැරෙන් සැරේට බෝග වෙනස් කරන්න සිද්ද වෙනවා.

කලින් වෙළඳාම කරමින් ඉඳලා ඒකෙන් පාඩු වුන හින්ද දැනට අවුරුදු අටකට විතර උඩදී වෙළඳාම අත් ඇරලා ගොවිතැන් කරන්න පටන් ගත්තු බව නඩේසු මහතා පැවසුවා. දැන් ටික කලක ඉඳන් බදු ඉඩම අයිති කාරයා වැඩියෙන් කුලිය ඉල්ලනවා. ගොවිතැනෙන් ලැබෙන ආදයම ගෙදර වියදමට යන්නම් සැහෙන නිසා වැඩිපුර කුලියක් ගෙවන්න පුළුවන්කමක් නැති බව ඔහු කියා හිටිය. ඉඩම් අයිතිකාරයා බල කරන හින්ද වැඩිපුර කුලියක් නොගෙව්වොත් මේ අවුරුද්ද අන්තිමේදී ඉඩම ආපහු දෙන්න වෙනවා. ඉඩම ආපහු දුන්නොත් ජීවත් වෙන්න ක්‍රමයක් නැතුව යන්න ඉඩ තියෙන නිසා වතුර තියෙන ඕනැම පළාතකට ගිහින් ගොවිතැන් කරන්න වුනත් සූදනම් බව ඔහු කීව. ඉඩමක් හොයා ගන්න දැන් හුඟක් මහන්සි වෙලා තියෙන නමුත් තවම පලක් වුනේ නැති බව ඔහු වැඩිදුරටත් කියා හිටිය.

**නවකිරිපුන්කුර්හි පදිංචි ටී. සින්නතුරෙයි මහතා අපට කියා හිටියේ වතුර පොම්පවලට අමතර කොටස් හොයා ගන්න තියෙන අමාරුකම සහ බීජ අර්තාපල් හිඟකම ගැනයි.** සින්නතුරෙයි මහතාගේ වයස අවුරුදු 36 යි. කලින් පොලිස් කොස්තාපල් කෙනෙක් හැටියට සේවය කරලා දැනට අවුරුදු තුනකට විතර උඩදී සිංහල ප්‍රවීනතා විභාගයෙන් සමර්ථ වෙන්න බැරි වුන නිසා පොලිස් සේවයෙන් අස්වුනා කියලා ඔහු අප සමහ කීව. එද ඉඳලා ඔහු තමන්ට අයිති ඉඩම අක්කර 1/2 කුත්, බද්දට ගත්තු ඉඩම් අක්කර 3/4 කුත් වගා කරගෙන යනවා. ගොවිතැන් වැඩවලින් නිවාඩු ලැබෙන හැටියට ඔහු තමන්ට අයිති කාර් එකේ වැඩ කරනවා. කාර් කුලිය හැටියට ලැබෙන ආදයම ඇරෙන්න ගොවිතැනෙන් සැහෙන ආදයමක් ලැබෙන බව ඔහු කියා හිටියා. දැනට තමන්ට ලැබෙන ආදයම ප්‍රමාණවත් නිසා ගොවිතැන් කරන්න තව ඉඩම් ලබා ගන්න අදහසක් නැති බව ඔහු වැඩිදුරටත් කියා හිටිය. වතුර පොම්ප ගැන කතා කරමින් ඔහු කිව්වේ තමාට අයිති වතුර පොම්පය අවුරුදු 14ක් විතර පරණ බවත් හොඳ වර්ගයේ අළුත් පොම්පයක් හොයා ගන්න එක අමාරු වැඩක් බවත් කියලයි. අළුත් පොම්පයක් හොයා ගන්න තුරු දැන් තියෙන පොම්පයට අමතර කොටස් හොයා ගන්නත් අමාරු බව ඔහු පැවසුවා. සින්නතුරෙයි මහතා දිගටම වගා කරගෙන ආවෙ ළූනු, මිරිස් සහ අර්තාපල්. ගිය වතාවෙ බීජ අර්තාපල් හොයා ගන්න බැරි වුන නිසා ඒ වෙනුවට දුම්කොල වවන්න සිද්ද වුන බව ඔහු කිව්වා. හොඳ ආදයමක් ලැබෙනවා වගේම අනික් බෝගවලට වඩා දුම්කොළ වවන්න ලේසියි කියලයි ඔහු කියා හිටියෙ.

**අච්චුවේලි දකුණේදී අපට මුන ගැහුන තව ගොවි මහතෙක් මේ ප්‍රශ්නය ගැන කතා කළේ ටිකක් වෙනස් විදියකට. ඔහුගේ නම කේ. අරුනාවලම්.** වයස අවුරුදු 55 යි. ඔහු ගොවිතැන් කරන අක්කර 1 1/2 න් අක්කර 1/4 ක් ඔහුටම අයිතියි. ඉතුරු හරිය බදු ඉඩම් බව ඔහු පැවසුවා. ලඟදි තව ඉඩම් අක්කරයක් සල්ලිවලට ගන්න ඔහුට පුළුවන් වුන බවත්, දැනට එම ඉඩමේ පවුලක් පදිංචි වී ඉන්න නිසා තවම ගොවිතැන් කරන්න පටන් ගත්තේ නැති බවත් අරුනාවලම් මහතා කියා හිටිය. ඒකෙ පදිංචි වෙලා ඉන්න අයට යමක් දීල ඉක්මණින් ඉඩම භාර දෙන්න කියලා දැනටමත් ඉල්ලීමක් කරලා තියෙනවා යයි ඔහු අප සමහ පැවසුවේ තරමක සන්තෝසයෙන් බව අපට පෙනී ගියා. ඔහු කියන හැටියට ගොවිතැනෙන් ලැබෙන ආදයම ණය වෙන්නෙ නැතුව වැඩ කටයුතු කරගෙන යන්න හොඳටම ඇති. ලොකු ළමයින් පස් දෙනෙක් ඉන්න ඔහුගේ පවුලේ වැඩිමලා ඇපෝතිකරි කෙනෙක් බව ඔහු තරමක ආඩම්බරයෙන් අප සමහ පැවසුවා. ඔහු කිව්වේ තව ඉඩමක් සල්ලිවලට ගන්න වුනත් පුළුවන්කමක් තියෙන බවයි. නමුත් තමන්ට ලැබෙන ආදයම ප්‍රමාණවත් නිසා එහෙම කරන්න උවමනාවක් නැහැ කියලා ඔහු කීවා. අරුනාවලම් මහතා කියන හැටියට ඔහු උත්සාහ කරන්නෙ වගා කරන බිම ප්‍රමාණය වැඩි කර ගන්න නොවෙයි; තියෙන ඉඩම් ටිකෙන් පලදාව වැඩි කර ගන්නයි. උනන්දුව තියෙනව. නම් එහෙම බැරිකමක් නැහැ කියලා



**වගා කරන ඉඩම ප්‍රමාණය වැඩි කර ගන්නවා වෙනුවට, පණස් පස් හැවිරිදි කේ. අරුනාවලම් මහතා උත්සාහ කරන්නේ දැනට තියෙන ඉඩම් ටිකෙන් ලැබෙන පලදාව වැඩි කර ගන්නයි.**

ඔහු කියා හිටියේ ලොකු ආත්ම විශ්වාසයක් ඇතුව බව අපට පෙනී ගියා. ඔහු කියන හැටියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් දෙන උපදෙස් පිළිවෙලට වැඩ කරනව නම්, ඒ වගේම හැම වැඩක්ම මහන්සි වෙලා කරනවා නම්, සාමාන්‍යයෙන් අක්කරයකින් ලැබෙන පලදාව දෙගුණයක් කර ගන්න එක අමාරු වැඩක් නොවෙයි.

**වතුර පොම්ප ගැන ඒ තරම් විශ්වාසයක් නැති, ඒ වගේම හැමදම අනුන්ගෙ ඉඩම්වල ගොවිතැන් කරන්න කැමැත්තක් නැති ගොවි මහත්මයෙක් අපට මුන ගැහුනා. ඔහුගේ නම එස්. රාජා, වයස අවුරුදු 60 යි.** අවුරුදු 40 ක් විතර ගොවිතැන් කරලා හොඳ පළපුරුද්දක් තියෙන රාජා මහතා පදිංචිව ඉන්නේ කන්කසන්තුරේ, මයිලිඩ්ඩි කියන ගමේ. දැනට අවුරුදු 40 කට කලින් මලයාවේ අච්චු කන්තෝරුවක වැඩ කරමින් ඉඳලා, ඉඩම් බලා හදගෙන ඉන්න කවුරුවත් නැති හින්ද ගමට ඇවිත් ගොවිතැන් කරන්න පටන් ගත්ත බව ඔහු පැවසුවා. ඔහුගේ දරුවන් පස් දෙනාගෙන් එක්කෙනෙක් පුතෙක්. එක දුවෙක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවිකාවක් හැටියට වැඩ කරනවා.

තමන්ගේ සහෝදරියට අයිති ඉඩම් අක්කර 3/4 ත් එක්ක ඉඩම් අක්කර 3 ක් ගොවිතැන් කරන බව ඔහු පැවසුවා. තමන්ට අයිති තව ඉඩම් අක්කර තුනක් තියෙන නමුත් ඒ ඉඩමෙ වතුර නැති හින්ද ගොවිතැන් කරන්න අමාරුයි කියලා ඔහු කිව්වා. එහි ළිඳක් හාරන්න රු. 10,000/- ක් විතර වියදම් වෙනවා. මෙච්චර කල් ඒ ඉඩමේ ළිඳක් හාරන්න උනන්දු වුනේ නැත්තේ ගොවිතැන් කරන්න කරදරයක් නැතුව බදු ඉඩම් හොයා ගන්න පුළුවන් වුන නිසා බව ඔහු කියා හිටියා. නමුත් දැන් බදු ඉඩම් හොයා ගන්නත් ටිකක් අමාරු නිසා ලඟදීම ඒ ඉඩමෙ ළිඳක් හාරලා ගොවිතැන් කරන්න පටන් ගන්නවා යයි ඔහු කීව. හැමදම අනුන්ගේ ඉඩම්වල ගොවිතැන් කරනවාට වඩා අමාරුවෙන් හරි තමන්ගෙම ඉඩම් දියුණු කර ගන්න එක හොඳ නේද? කියලා ඔහු ප්‍රශ්න කලා.



හැමදම අනුන්ගෙ ඉඩම්වල ගොවිතැන් කරනවාට වඩා කොහොම හරි තමන්ටම ඉඩම් කෑල්ලක් හොයා ගන්න කවුරුත් හිතට ගන්න ඕනෙ කියලා එස්. රාජා මහතා කියා හිටිය.

රාජා මහතා ඇනු, මිරිස්, එළවළු සහ කෙසෙල් වවලා තියෙනවා. තමා ගොවිතැන් කරන්නෙ බෝගවල මිළ ඉහල පහල යන හැටියට බවත්, ගොවිතැනෙන් ලැබෙන ආදායමෙන් කරදරයක් නැතුව කාලා ඇඳලා යමක් ඉතුරු කරලා තියෙන බවත් ඔහු කියා හිටිය. වතුර ප්‍රශ්නය ගැන කතා කරමින් ඔහු කිව්වේ නිතරම කරදර දෙන නිසා වතුර පොම්ප ගැන ඒ තරම් විශ්වාසයක් නැති බවයි. ඔහුගේ ඉඩමේ තියෙන ලිඳෙන් "පර්සියන් රෝද" ක්‍රමයට හරක් යොදවලා ලේසියෙන් වතුර ඇද ගන්නවා. ගොවිතැන් වලට මේ ලිඳෙන් ඇද ගන්න වතුර හොඳටම ඇති කියලා ඔහු කීවා. කලින් කියාපු ඉඩමත් වවන්න පටන් ගත්තාම තව ටිකක් වැඩියෙන් ඉතුරු කරලා කරදරයක් නැතුව දූල හතර දෙනා දීග දෙන්න පුළුවන් බව ඔහු වැඩි දුරටත් පැවසුවා.

**යාපනය දිස්ත්‍රික්කයෙන් අන්තිමට අපට මුන ගැහුනේ අවුරුදු 18 ක තරුණයෙක්. ඔහුගේ නම එන්. දේවදසන්.** ගොවිතැන් වැඩ ගැන පුදුම ආසාවක් දක්වන දේවදසන් මහතා කිව්වේ ඔහුගේ එකම බලාපොරොත්තුව කොහෙන් හරි ඉඩම් කට්ටියක් හොයාගෙන තනියම ගොවිතැන් කරන්න බවයි. කන්කසන් තුරේ, මයිලිඩ්ඩි කියන ගමේ පදිංචි ඔහු වයස අවුරුදු දොලහක් විතර කාලෙදී පාසැල් යාම නවත්තලා තාත්තගේ ගොවිතැන් වැඩවලට උදව් වෙන්න පටන් ගත්තා. තම පවුලේ සහෝදර සහෝදරියො නම දෙනෙක් ඉන්න බවත්, පවුලේ තුන්වෙනියා තමා බවත් ඔහු පැවසුවා.

දේවදසන් මහතාගේ තාත්තා බදු ඉඩම් අක්කර දෙකක ඇනු, මිරිස්, තක්කාලි සහ වෙනත් එළවළු වවල තියෙනවා. ගොවිතැනෙන් ලැබෙන ආදායම ගැන කතා කළ ඔහු කිව්වේ වැඩිම ආදායමක් ලැබෙන්නෙ මිරිස් වලින් බවයි. තමන්ගේ දැනීමේ හැටියට තාත්තට ලැබෙන ආදායම් කරදරයක් නැතුව කාලා ඇඳලා යමක් ඉතුරු කරගෙන ජීවත් වෙන්න හොඳටම ඇති බව ඔහු පැවසුවා. තමන් පදිංචිවෙලා ඉන්න ගෙය හදු ගත්තෙත් තාත්තගෙ ආදායමෙන්. දැනට ගොවිතැන් කරන ඉඩම් අනුන්ට අයිති නිසා කොහොම හරි ඉඩම් කට්ටියක් ලබා ගන්න තාත්තා නිතරම උත්සාහ කරන බවත්, ගොවිතැන් කරන්න ඉඩමක් හොයා ගන්න එක හරිම අමාරු වැඩක් බවත් දේවදසන් මහතා කියා හිටියා. තනියම ගොවිතැන් කරලා යමක් හම්බ කර ගන්න තමාට ලොකු ආසාවක් තියෙන නිසා ඕනෑම පලාතකට ගිහින් වැඩ කරන්න කැමති බව ඔහු කිව. නමුත් ගොවිතැන ඇරෙන්න වෙන මොනම රක්ෂාවකටවත් කැමති නැති බව ඔහු තදින් කියා හිටිය. ඔහු කිව්වේ ලඟදීම තාත්තාගෙන් සල්ලි ටිකක් ඉල්ලගෙන මොන විදියකින් හරි තනියම ගොවිතැන් කරන්න පිට පලාතකින්වත් ඉඩමක් හොයා ගන්න අධිෂ්ඨාන කරගෙන ඉන්න බවයි. ඒ අධිෂ්ඨානය ඉක්මණින්ම ඉෂ්ට වේවා කියලා අපිත් ප්‍රාර්ථනා කළා.

❁ ❁ ❁ ❁

අපට මුන ගැහුන ගොවි මහත්වරු කියා හිටිය කතා වලින් වැදගත් කරුණු කීපයක් පැහැදිලි වෙනව. ගොවිතැන් වැඩ ගැන ඒ හැම කෙනෙක්ම කතා කළේ තද ඇල්මක් ඇතුවයි. ඒ වගේම, ගොවිතැන හොඳ වැදගත්, නිදහස තියෙන රක්ෂාවක් හැටියට ඔවුන් සළකන බව අපට පෙනී ගියා. කොයි තරම් කරදර තිබුනත් කවදවත් ගොවිතැන ඇරෙන්න වෙන රක්ෂාවක් කරලා නැහැ කියලා සමහර ගොවි මහත්වරු කියා හිටියේ තරමක ආඩම් බර ගතියකින්.

දිස්ත්‍රික්ක වශයෙන් බලනකොට, වගා කරන ඉඩම් ප්‍රමාණය කුඩා වුනත්, වැඩිම ආදායම් ලබන ගොවි මහත්වරු ඉන්නෙ යාපනයේ බව අපට පෙනී ගියා. කලින් පිට රටින් ගෙන්නපු මිරිස්, ඇනු, අර්තාපල් වගේ බෝගවලට ආණ්ඩුවෙන් සහතික මිළ නියම කරලා තියනවට අමතරව වෙළෙඳ පොලේ ඉහළ මිළ ගණන් ලැබෙන එක මේ තත්වය ඇති වෙන්න ප්‍රධාන හේතුව වශයෙන් සළකන්න පුළුවනි. කොහොම වුනත්, යාපනයේදී අපට මුන ගැහුන ගොවි මහත්වරු ගොවිතැනෙන් හුඟක් සෑහීමකට පත් වෙලා ඉන්න අය. එකම ගොවි මහත්තයෙක්වත් ගොවිතැන අත හැරලා වෙන

රක්ෂාවක් කරන්න කැමතියි කියලා කිව්වෙ නැහැ. මේ කාරණයෙන් පැහැදිලි වෙන්නෙ යාපනයේ ගොවි මහත්වරුන්ට කොයි විදියේ බාධක තිබුනත් ඒවා මැඩ පවත්ත ගෙන දිගටම ගොවිතැන් වැඩ කරගෙන යන්න තරම් උනන්දුවක් තියෙන බවයි.

නමුත් කෑගල්ල දිස්ත්‍රික්කයේ තියෙන තත්වය මීට වඩා හුඟක් වෙනස් බව අපට පෙනී ගියා. ප්‍රධාන ප්‍රශ්න වශයෙන් නම් මේ දිස්ත්‍රික්ක දෙක අතරේ පොදු සමාන කමක් තියෙනව. වෙන විදියකින් කියනව නම් කෑගල්ල දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හිඟකමත්, වතුර හිඟකමත් යාපනයෙත් තදින්ම පවතිනව. නමුත් සාමාන්‍යයෙන් යාපනේ ගොවි මහත්වරු අතරේ දකින්න තියෙන අතමිට සරු කම හේතු ගණනාවක් හින්ද කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවි මහත් වරු අතරේ පෙනෙන්න නැහැ. මිරිස්, ළූනු, අර්තාපල් වගේ ඉක්මනින් වාසි ලැබෙන බෝග ජාති කෑගල්ල දිස්ත්‍රික්කයේ සරුවට වැවෙන්නෙ නැතිකම මේ වගේ තත්වයක් ඇති වෙන්න ප්‍රධාන හේතුව හැටියට හිතා ගන්න පුළුවනි. කොහොම වුනත්, අනුන්ට අත පාන්නෙ නැතිව ජීවත් වෙන්න නම් මොනව මොනව හරි වගා කර ගන්න ඕනෑ කියන හැඟීම ඔවුන් හැම කෙනෙකුටම තියෙනව.

අම්පාර දිස්ත්‍රික්කයේ පානම වැනි ප්‍රදේශ වල ගොවි මහත්වරු අපට පෙන්නල දුන්න ප්‍රධාන ප්‍රශ්න අනික් දිස්ත්‍රික්ක දෙකට වඩා වෙනස්. ඉඩම් හිඟකමක් ඔවුන්ට නැහැ. වතුර හිඟකම වෙනුවට ඔවුන්ට තියෙන්නෙ වතුර ලබා ගන්න වාරිමාර්ග පහසුකම් නැතිකමයි. ඇත්ත වශයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ එක ප්‍රදේශයක වතුර වැඩිකමත් ප්‍රශ්නයක් වෙලා තියෙන බව අපට දැන ගන්න ලැබුනා. ඒ වගේම වගා කරල තියෙන ඉඩම් සීනි සංයුක්ත මණ්ඩලයට පවරා ගන්න යනවා කියන බයකුත් අක්කරපත්තුවේ සමහර ගොවි මහත්වරු අතරේ පවතින බව අපට පෙනුන. මේ වගේ ප්‍රශ්න තියෙද්දීත් අපට මුන ගැහුන ගොවි මහත්වරු වැඩි දෙනෙක් කරදරයක් නැතිව ජීවත් වෙන්න තරම් සෑහෙන ආදායමක් ලැබෙන බව කියා හිටිය.

මේ දිස්ත්‍රික්ක තුන ගැන පොදුවේ කතා කරන කොට විශේෂයෙන් සඳහන් කරන්න පුළුවන් එක කාරණයක් තියෙනවා. ඒ කාරණය තමයි කවුරුත් වගේ උපදෙස් පිළිපදින්න දක්වන කැමැත්ත. තමන් ගොවිතැන් කරන ඉඩමෙන් දැනට ලැබෙන පලදාව වැඩි කර ගන්න පුළුවන් විදියේ උපදෙස් පිළිපදින්න ටිකක්වත් අකමැත්තක් දක්වන එකම ගොවි මහත්තයෙක්වත් අපට මුන ගැහුනෙ නැහැ. නමුත් ඔවුන් වැඩි දෙනෙක් කියා හිටියේ දැනට මුන පාන්න වෙලා තියෙන ප්‍රශ්න නිසා තමන්ගෙ ගොවිතැන් කටයුතු මීට වඩා හොඳ තත්වයකට ගෙනෙන්න අමාරු බවයි. ඔවුන් පෙන්නල දුන්න ප්‍රශ්නවලට පිළියම් යොදනව නම් කොහොම හරි, දැනට වඩා දියුණුවක් ලබා ගන්න වැඩි කලක් යන්නෙ නැහැ කියලා හුඟ දෙනෙක් කියා හිටිය. ගොවිතැන් කරන්න තව ඉඩම් ලැබෙනව නම් හොඳයි කියල වැඩි දෙනෙක් කියා හිටියෙ ඒ හැම කෙනෙකුටම ගොවිතැන් කටයුතු වලින් සාර්ථක විදියට ජීවිකාව ගෙනියන්න පුළුවන් බව හොඳට තේරුම් අරගෙනයි.